# මියනපලාව අලි වෙද පරපුර

**තාරක උමයංග දිල්ශාන් / සමාධි නවෝද්‍යා පීරිස් ***

මිනිසා ද ඇතුළුව ලොව සියලුම සත්ත්වයින් තම ජීවිත කාලය තුළ අනිවාර්යයෙන්ම මුහුණපානු ලබන ගැටළු ලෙස රෝගීවීම හා අනතුරුවලට මුහුණ දීම දැක්විය හැකිය. මෙය මිනිසාට පමණක් නොව ලොව සියලුම ජීවී විශේෂයන්ට බලපානු ලබන මූලධර්මයකි. මිනිසා සම්බන්ධයෙන් සලකන විට මෙම ගැටළු සඳහා විසඳුම් ලෙස වෙදකම හෙවත් වෛද්‍ය ශාස්ත්‍රය ගොඩනැගී තිබේ. හෙළ වෙදකම, ආයුර්වේද වෙදකම, බටහිර වෙදකම ආදිය ශ්‍රී ලංකාව තුළ මානව රෝග නිවාරණය සඳහා යොදාගනු ලබන වෛද්‍ය ධාරවන් වේ. මිනිසා වෙනුවෙන් පමණක් නොව සතුන්ට ඇතිවන රෝග නිවාරණය සඳහා ද රෝග නිවාරණ ක්‍රමවේද මිනිසා විසින් නිර්මාණය කරගන්නා ලදී. ඒ ඒ සතුන් සඳහා ගැලපෙන වෛද්‍ය ක්‍රමවේද සියල්ලම එක්තැන් කරමින් මිනිසා පශු වෛද්‍ය ශාස්ත්‍රය නිර්මාණය කළේය. බටහිර වෛද්‍ය ක්‍රමය තුළ සියලුම සතුන් සඳහා යොදාගනු ලබන්නේ පශු වෛද්‍ය ක්‍රමය වේ.

එසේ වුවත් ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ අලි ඇතුන් සඳහා පමණක්ම යොදා ගන්නා සුවිශේෂී දේශීය අලි වෙද ශිල්පයක් පවතී. ශ්‍රී ලංකාවේ මිනිසා හැරුණු කොට එක් සත්ත්ව කොට්ඨාසයකට පමණක් සුවිශේෂී වූ ආයුරුවේදීය නොහොත් දේශීය වෛද්‍ය ශිල්පයක් උරුම එකම සත්ත්වයා අලියා වේ. ගෘහස්ථකරණයට ලක් වූ නොයෙකුත් සතුන් අතරත් මෙම විශේෂ සැලකිල්ල උරුමව ඇත්තේ අලි ඇතුන්ට පමණකි. ජනප්‍රවාදයන්ට අනුව වර්තමානයේ මෙරට පවතින දේශීය අලි වෙදකමේ ඉතිහාසය රජ කාලය දක්වාම විහිදී යන්නකි. ඒ අනුව හීලෑ අලි ඇතුන් සඳහා මෙරට ජනතාව සෑම විටකම සුවිශේෂී අවධානයක් හා සැලකිල්ලක් දැක්වූ බව පැහැදිලි වේ. ශ්‍රී ලංකාවේ දැනට ඉතිරිව ඇති අලි වෙද පරම්පරා දෙකකි. එම පරම්පරා සතුව ඒවායේ ආදිතමයන් විසින් රචනා කරන්නට යෙදුනු අලි වෙදකම පිළිබඳව වූ පුස්කොළ පොත් පවා ඇත.

1. මියනපලාව අලි වෙද පරපුර
2. හත්පොතේ අලි වෙද පරපුර

මෙයින් මේ වන විටත් සිය පරම්පරාවෙන් ඍජුවම පැවත එන්නා වූ අලි වෙද පරපුර මියනපලාව අලි වෙද පරපුර වේ.

* තාරක උමයංග දිල්ශාන් / සමාධි නවෝද්‍යා පීරිස්

ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය, පුරාවිද්‍යාව - කැලණිය විශ්වවිද්‍යාලය,

දේශීය හස්ති වෛද්‍යාචාර්යය, දළදා මාලිගාවේ ඇත් පන්ති භාරකරු ප්‍රදීප් මියනපලාව මහතා සමඟ කළ සම්මුඛ සාකච්ඡාවක් ඇසුරිණි.

**මියනපලාව අලි වෙද පරපුර**

ඈත අතීතයේ පටන්ම මෙරට පැවති හස්ති වෙද පරපුරවල් අතර වූ පරම්පරාවකි, මාවනැල්ල උස්සාපිටිය මියනපාලාවේ අලි වෙද පරපුර. නමුත් එහි ඉතිහාසය ඉදිරිපත් කිරීමට තරම් ලිඛිත සාධක හමු නොවුනද ජනතාව තුළ ඇති වී තිබෙන සංවාද නම් බොහෝය. මියනපලාව වෙද පරපුර 60 සහ 70 දශකවල සුප්‍රසිද්ධව සිටි එම්.ඩබ්ලිව්.මියනපලාව වෙද මහතා පිළිබඳව මේ ක්ෂේත්‍රයේ බොහෝ අය කතා කරනුයේ ඉමහත් භක්තියෙනි. මියනපලාව වෙද පරපුරේ වර්තමාන පුරුක වන ශ්‍රී දළදා මාලිගාවේ ඇත් පන්තිය භාර නිලධාරී හස්ති වෛද්‍ය ප්‍රදීප් මියනපලාව මහතා පවසන පරිදි ඉතා අසාධ්‍ය රෝග වැළඳුණු අලි ඇතුන් පවා කෙටි කාලයක් තුළ නිවැරදි ප්‍රතිකර්ම කරවා සුවපත් කර තිබේ. එම කාලය තුළ උස්සාපිටියේ මියනපලාව නිවස තුළ නිරන්තරයෙන්ම අලි ඇතුන් විශාල සංඛ්‍යාවක් ගාල් කර සිටි බවද පැවසේ.

1982 වසරේ ඔහුගේ අභාවයෙන් පසු මුණුබුරු ඩබ්.එස්.මියනපලාව මහතා මෙම වෙදකම ඉදිරියට කරගෙන යාමට සමත් වේ. ඒ සඳහා එවකට පැවති රජයන්ගෙන් රාජ්‍ය අනුග්‍රහය පවා ඔහුට හිමිවීම විශේෂත්වයකි. එමෙන්ම ආයුරුවේද වෛද්‍ය සභාව තුළ පාරම්පරික අලි වෙදකම ලියාපදිංචි කරගැනීමට දැඩි උත්සහයක් එතුමන් මෙන්ම එතුමාගේ පුත් ප්‍රදීප් මියනපලාව මහතා ද ගෙන ඇත. 2003 වසරේ දී ආසියාවේ පළමු අලි රෝහල ලෙස ඇත් සුව සෙවන ඔහුගේ නිවස යාබදව ගොඩනැගීමට රාජ්‍ය අනුග්‍රහය පවා හිමි වී තිබිණි. ඒ තුළ අලි වෙදකම මෙන්ම හීලෑ අලි ඇතුන් තෝරා ගැනීමට ද වැඩසටහන් යොජනා වී තිබුණ ද ඒ සියල්ල බිඳ වැටුණේ අලියෙකුගේ පහර දීමෙන් ඩබ්.එස්.මියනපලාව මහතාගේ අභාවය නිසාය. ඔහුගෙන් පසු වර්තමානයේ මියනපලාව පාරම්පරික වෛද්‍ය ශාස්ත්‍රය ඉදිරියට ගෙනයනු ලබන්නේ ඩබ්.එස්.මියනපලාව මහතාගේ පුත් ප්‍රදීප් මියනපලාව මහතා ය. ඔහු පවසන පරිදි ඔහු සතුව සිය පාරම්පරික වෙදකම පිළිබඳ ලියැවුණු පුස්කොළ පොත් ආදිය විශාල ප්‍රමාණයක් තිබුණ ද ඒ සියල්ලට වඩා තම පියාගෙන් උගත් දැනුම, ආභාසය සහ පළපුරුද්ද මත වෛද්‍ය ශාස්ත්‍රය ඉදිරියට ගෙනයන බවයි.

සිය පියා නිවස තුළ හස්තීන්ට වෙදකම් සිදුකරන අවස්ථාවලදී ඊට සහායවෙමින් ලබාගත් පුහුණුව මෙම කාර්යය සාර්ථකව කරගෙන යාමට ඔහුට ඉවහල් වී ඇත. මියනපලාව හස්ති වෛද්‍ය පරම්පරාවටම ආවේණික ගෙඩි තුවාල පුළුස්සා කරනු ලබන ප්‍රතිකර්මය ඉතා සාර්ථක ප්‍රතිකර්මයකි. අලි ඇතුන්ට සෑදෙන තුවාල ආදිය උඩු දිවීම සිදුවේ. එය උත්සන්නවීමට පෙර ප්‍රතිකාර නොකළොත් හස්තියාගේ ජීවිතය පවා අවධානමකට ලක් වේ. නමුත් මියනපලාව වෙද පරපුරේ පවතින පිළිස්සුම් ප්‍රතිකාර ක්‍රමය යටතේ යකඩ කුරක් රත්කොට අදාළ තුවාල ඇති ස්ථානය පුළුස්සා බෙහෙත් ගැල්වීම සිදුකරයි. මෙම ක්‍රමය යටතේ අදාළ ස්ථානයේ තුවාලය යළි කිසිදු දිනක මතු නොවන ආකාරයෙන් මෙන් ම කැලළක් නොසිටින ලෙස නිට්ටාවටම සුව කළ හැකිය. මේ සියලු වෙදකම් ඔවුන් අතීතයේ සිටම සිදුකරනුයේ පාරම්පරික චාරිත්‍ර වාරිත්‍ර අනුකූලවය. එනම් නැකත්, සුභ හෝරාවන් සහ රාහු කාලය ආදිය පිළිබඳව ද සැලකිලිමත්ව ය. අසුභ වෙලාවන්වලදී ප්‍රතිකාර ආරම්භ කරන ලද අවස්ථාවක කොතෙක් ප්‍රතිකාර කලත් සුව කරවීම අසීරු බවත් කරන ලද බෙහෙත් හස්තියාට ප්‍රත්‍යක්ෂ වනුයේ සුභ වෙලාවන්වලදී ප්‍රතිකාර ආරම්භ කිරීමෙන් බව ඔවුන් පවසනුයේ සිය පාරම්පරික අත්දැකීම් තුළිනි. පරපුරේ ආදිතමයෙකු වන

එම්.ඩබ්.මියනපලාව මහතාට හස්තියෙකු දුටු සැනින් එම හස්තියාගේ රෝග නිශ්චය කිරීමට හැකියාව තිබූ බව පැවසේ. එසේම මෙතුමාට මෙරට සිටි දරුණු ගණයේ ඉතා සැර අලි පවා මෙල්ල කිරීමට හැකි වූ බව පැවසේ. මෙම පරපුර අලි වෙදකමට මෙන්ම අලි ඇතුන් රැකබලා ගැනීමට සමත් පරපුරකි. අලි ඇතුන්ට නිරන්තරයෙන් වැළඳෙන බඩේ අමාරු, පණු අමාරු ආදියේ සිට අලින්ගේ අපිරිසිඳුකම ආදිය නිසා වැළඳෙන පාත රෝග ආදී බොහෝ රෝගවලට ද සාර්ථකව ප්‍රතිකාර කිරීමට මේ පරපුරේ වෙදකම සමත්වේ.